උඩුනුවර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
----------------

මෙම වාර්තාවේ 1.3 හා 2.2.3 ඡේදවල දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

(අ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු.143,540 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම 03 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුර නැගුම ව්‍යාපෘතියෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.563,851 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම 05 ක් රු.109,548 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා, එම වත්කම් රු.454,303 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විනාශ කරන ලද රු.62,619 ක් වූ පුස්තකාල පොත්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කිරීමකින් තොරව 2018 වර්ෂයේ විනාශ කරන ලද රු.71,196 ක පොත්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් කපා හැර තිබුණි.

(ඈ) රු.40,000 ක් වටිනා අත් කරත්ත 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.381,501 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.762,337 ක උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) මුද්දර ගාස්තු ලේඛනය අනුව, 2017 ජනවාරි 01 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.62,559,862 ක් ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමේ ආරම්භක ශේෂය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළව වරිපනම් අධි ගාස්තු බිල් කිරීම රු.982,169 ක් වූ අතර, ඉන් රු.178,250 ක් වර්ෂය තුළ ලැබී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු වරිපනම් අධි ගාස්තුව රු.803,919 ක වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ රු.418,499 ක උසාවි දඩ ලැබීම් ආදායම් ගිණුමේ පොදු පරිපාලනයේ වරෙන්තු ගාස්තු හා දඩ යටතේ දක්වා තිබිය දී, එම වටිනාකම නැවතත් සෞඛ්‍ය සේවා යටතේ වර්ෂයේ ආදායමක් ලෙස දක්වා, ලැබිය යුතු ආදායම් යටතේ ද ගිණුම්ගත කර තිබුණි.

(ඒ) පෙර වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.189,661 ක වරිපනම් ආදායමක් හිඟ හිටි වරිපනම් ගිණුමට ගිණුම්ගත කර ඇතත්, එහි අවසන් ශේෂයට ගලපා නොතිබුණි.

(ඓ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.54 ක වාහන නැවතුම් ගාස්තු මුදලක් රු.500,054 ක් ලෙස විශේෂ ගාස්තු ආදායම් ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.500,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඔ) අය ශීර්ෂ 04 කින් ලැබී තිබුණු රු.40,242,820 ක ආදායම්, අදාළ අය ශීර්ෂයන්ට බැර කිරීමකින් තොරව අවස්ථා 09 කදී, වෙනත් අය ශීර්ෂවලට බැර කර තිබුණි.

(ඕ) පොදු පරිපාලන වැඩසටහනේ වෙනත් ආධාර (1.71 හා 1.73) යටතේ දක්වා තිබූ රු.36,955,750 ක ආදායම, නැවත ප්‍රාග්ධන ආදායම් (1.81) යටතේ ද දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා ද තිබුණි.

(ඖ) පොදු පරිපාලනය වැඩසටහනේ ප්‍රාග්ධන ආදායම් යටතේ (1.83) දක්වා තිබූ රු.18,123,973 ක ආදායම නැවත වෙනත් ආදායම් (1.70) යටතේ දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) සෞඛ්‍ය සේවා වැඩසටහනේ බලපත්‍ර ගාස්තු යටතේ දක්වා තිබූ රු.427,200 ක ආදායම නැවත වෙනත් ආධාර යටතේ දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඛ) පෙර වර්ෂයට අදාළව වැය විෂයන් 12 ක් යටතේ ගෙවිය යුතුව තිබුණු රු.1,148,816 ක වියදම් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කිරීමේ දී, සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්වලට ගැලපීමෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ වියදම් වැඩිපුර දක්වා තිබුණි.

**(ග) පුස්තකාල ත්‍යාග ප්‍රදාන හා තරඟ පැවැත්වීම සඳහා වෙන් කර තිබූ රු.210,000 ක ප්‍රතිපාදන රු.370,000 ක් ලෙස වරදවා දක්වමින් හා වැය කිරීමට අපේක්ෂිත වියදම් හඳුනා නොගෙන මුළු ප්‍රතිපාදන මුදලම ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි.**

**(ඝ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය සේවා යටතේ ගෙවිය යුතු වැටුප් හා දීමනා රු.111,823 ක් නොගෙවූ වැටුප් හා වේතන ගිණුමේ සටහන් කිරීමකින් තොරව පොදු සැපයුම් ණයහිමි ගිණුමේ දක්වා තිබුණි.**

**(ඞ) සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයන් 10 කට අවස්ථා 10 ක දී 2018 වර්ෂයේ දී ගෙවන ලද රු.823,812 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණ**

**(ච) විවිධ තැන්පතු ශේෂය, ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වුවත්, රු.78,295 ක් වටිනා විවිධ තැන්පතු වටිනාකමක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.**

**(ඡ) සේවක ණය ලබා දීම වෙනුවෙන් පිහිටුවා ඇති 4070335 අංක දරන ලංකා බැංකුවේ ජංගම ගිණුමට පොදු කටයුතු සඳහා පිහිටුවා ඇති 4070181 අංක දරන ජංගම ගිණුමෙන් මාරු කරන ලද රු.3,000,000 ක මුදලක් දෝෂ සහගතව සේවක ණය ගිණුමට බැර කර තිබීම හේතුවෙන් සේවක ණය ගිණුම රු.3,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.**

**(ජ) සමාලෝචිත වර්ෂය තුළ රු.16,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 02 ක් කල් පිරීම හේතුවෙන් මුදල් කරවා ගෙන නැවත වෙනත් බැංකුවක ආයෝජනය කිරීමේ දී, එම වටිනාකම ආයෝජන ගිණුමට හර කර ප්‍රාග්ධන වත්කම් විකිණීමේ ආදායම් ගිණුමට බැර කර තිබුණි.**

**(ඣ) සමාලෝචිත වර්ෂය තුළ ආයෝජනය නොකරන ලද රු.1,000,000 ක්, ආයෝජන ගිණුම හර කර තිබීමෙන්, එම වටිනාකමින් ආයෝජන ගිණුම වැඩිපුර දක්වා තිබුණි.**

**(ඤ) 2014, 2015 සහ 2016 වර්ෂයන් තුළ සභා අරමුදල් හා බාහිර ප්‍රතිපාදන මත ඉටු කළ කර්මාන්ත 34 ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණු රු.1,588,852 ක එකතු වටිනාකමක් සමාලෝචිත වර්ෂය තුළ නැවත වරක් එම වටිනාකමින් ණයහිමි ගිණුම බැර කර ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු වියදම් ගිණුම හා ප්‍රාග්ධන වියදම් ගිණුම හර කර තිබුණි.**

**(ට) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,335,000 ක මුදලකට ගිවිසුම්ගත වී ඇතත්, එම වටිනාකම දෝෂ සහගතව රු.13,350,000 ක් ලෙස ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරීමෙන් ණයහිමියන් හා ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු වියදම් රු.12,015,000 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.**

**(ඨ) 2014 සිට 2016 දක්වා වර්ෂයන්වලට අදාළ පොදු තැන්පත් ගිණුමේ, ගිණුම්ගත කළ යුතු අත රැඳවුම් රු.501,103 ක මුදලක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.**

**(ඩ) සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගත නොවූ රු.1,375,000 ක් වටිනා කර්මාන්ත 10 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.**

(ඞ) බාහිර ප්‍රතිපාදන අපේක්ෂාවෙන් ඉටු කරන ලද කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතුව තිබුණු රු.2,057,425 ක මුදලක් රු.4,493,258 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් කර්මාන්ත ණයගැතියන් සහ ප්‍රාග්ධන ආධාර ආදායම් ගිණුම රු.2,435,833 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කළ ලිපි ද්‍රව්‍යවල වටිනාකම රු.397,964 ක් වුවත්, එය රු.593,735 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලිපි ද්‍රව්‍ය තොග ගිණුම රු.195,771 කින් අඩුවෙන් හා වර්ෂයේ ලිපි ද්‍රව්‍ය වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

## 1.3.2 නොසැසඳුණු ගිණුම්

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අවසන් ශේෂයන් හා 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් අතර ගිණුම් විෂයයන් 22 ක එකතුව රු.123,659,729 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයන් 13 ක ශේෂ හා අදාළ උපයෝගී ලේඛන අතර රු.54,822,229 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රා.ස.12 වැය ලේඛනයේ ශේෂයන් වියදම් ලෙජර් ගිණුමේ ඊට අදාළ ශේෂයන් අතර වැය විෂයන් 04 ක රු.869,004 ක ශේෂ නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ඈ) සේවක ණය ලේඛනය අනුව, ආපදා ණය ශේෂය සහ වැටුප් අංශයේ සේවක ණය තොරතුරු අනුව ශේෂය අතර නිලධාරීන් 56 දෙනෙකුගේ රු.452,108 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ඉ) කර්මාන්ත ණයහිමි ගිණුම අනුව, සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් රු.6,603,434 ක් වුවත්, ණයහිමි ලේඛනය අනුව වර්ෂය තුළ ගෙවීම රු.7,665,654 ක් වූයෙන් රු.1,062,220 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ඊ) ලිපි ද්‍රව්‍ය උපලේඛනය අනුව, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.150,877 ක් වුවත්, ගිණුම අනුව එය රු.594,003 ක් වූයෙන්, රු.443,126 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

## 1.3.3 අවිනිශ්චිත ගිණුම්

2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.16,667,314 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් වූ ආකාරය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### (අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 07 ක එකතු වටිනාකම රු.54,701,753 ක් වූ අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට පැවති ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතු වටිනාකම රු.34,596,380 ක් වූ අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

---

(අ) **2015** හා **2016** වර්ෂයන්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදු වූ දෝෂයන් ගලපා, **2017** ජනවාරි **01** දිනට ශේෂ පිරික්සුම පිළියෙල කර ඇතත්, සිදු කරන ලද ගැලපීම්වලට අදාළ ලේඛනගත තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.**122,864,467** ක් වූ ගිණුම් විෂයන් **09** ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඇ) සෞඛ්‍ය සේවා වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණු රු.**1,092,751** ක එකතු වටිනාකම සමන්විත වී තිබුණු එක් එක් ආදායම් විෂයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) **2017** දෙසැම්බර් මස රු.**24,185** ක වටිනාකමක් විශ්‍රාම වැටුප් හා දායක මුදල් වියදම් ගිණුම බැර කර නොගෙවූ වැටුප් හා වේතන ගිණුමට හර කිරීමට අදාළ වූ ගනුදෙනුව පිළිබඳව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) පොදු සැපයුම් ණයගිමි ගිණුමේ දක්වා තිබුණු රු.**16,940** ක ශේෂය පරීක්ෂා කිරීමට අවශ්‍ය ගෙවීම් විස්තර හා ලිපිගොනු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ රු.**132,479** ක මුදලක් සමුච්චිත අරමුදල හර කර ආයෝජන ගිණුම බැර කර ඇතත්, ඊට අදාළ ජ'නල් සටහන් හෝ ලේඛනගත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ කපාහළ රු.**19,401,177** ක කර්මාන්ත ණයහිමි ශේෂයට අදාළව හඳුනාගත හැකි උපලේඛනයක් හා ජ'නල් සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.6** අනුකූල නොවීම්

---

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) | 32 රීතිය | 10,288,937 (වර්ෂයේ බිල් කිරීම) | වරිපනම් බදු ගෙවිය යුතු වන සියලුම ගොඩනැගිලි හා ඉඩම් සම්බන්ධයෙන් වරිපනම් බදු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) | 59 රීතිය | -- | සභා බලප්‍රදේශය තුළ පවතින කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (iii) | 218 රීතිය | 111,927,750 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **1996 අගෝස්තු 06 දිනැති අංක 935/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 22(1) ඡේදය** | **--** | **ඉඩම් වෙන්දේසියට අදාළ අනු බෙදීමේ දී සභාවට පිරිනමන ලද පර්චස් 24 ක් සහ පර්චස් 46 ක බිම් කොටස් 02 ක ප්‍රජා විනෝද කටයුතු හෝ එළිමහන් ප්‍රදේශයක් වශයෙන් සංවර්ධනය නොකර භාවිතයකින් තොරව පැවතුණි.** |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| **(i)** | **396 (ඇ)** | **31,562** | **ජංගම ගිණුමකට අදාළ නිකුත් කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.** |
| **(ii)** | **571(3)** | **461,822** | **1980 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 191 කදී තැන්පත් කර තිබූ ගිවිසුම් තැන්පතු සහ විවිධ තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.** |
| **(ඇ)** | **2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | **--** | **පරිගණක හා පරිගණක උපාංග සටහන් කිරීමට ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.** |
| **(ඉ)** | **පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ** | | |
| **(i)** | **2011 ඔක්තෝබර් 14 දිනැති අංක 2/2011 දරන චක්‍රලේඛයේ 01(04) ඡේදය** | **1,640,654** | **ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කර්මාන්ත 03 ක සංවර්ධන කටයුතු සිදු කර තිබුණි.** |
| **(ii)** | **2017 දෙසැම්බර් 27 දිනැති සීපීසී/සීඑල්පී1/1 අංක දරන චක්‍රලේඛයේ 03 වන ඡේදය** | **--** | **පළාත් පාලන ආයතනවලට අදාළව අරමුදල් රැස් කිරීම සඳහා එක් පොදු මුදල් ගිණුමක් පමණක් අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය අනුව පවත්වා ගත යුතු වුවත්, ඊට අතිරේකව සේවක ණය ගනුදෙනු සඳහා වෙනත් ජංගම ගිණුමක් පවත්වා ගෙන ගොස් තිබුණි.** |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,190,418 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,207,972 ක් විය.**

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,770,000 | 12,484,060 | 8,276,425 | 17,044,620 | 7,257,142 | 5,005,511 | 3,513.992 | 14,364,585 |
| (ii) | කුලී | 1,473,000 | 1,280,180 | 1,205,740 | 800,262 | 1,206,000 | 1,556,752 | 1,657,160 | 66,860 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,301,000 | 1,411,600 | 1,411,600 | -- | 1,651,500 | 2,350,000 | 2,350,000 | -- |
| (iv) | වෙනත් ආදායම් | 29,000,000 | 32,857,590 | 38,963,237 | 15,584,440 | 30,374,000 | 849,546,335 | 731,061,716 | 41,367,021 |
| | එකතුව | 38,544,000 | 48,033,430 | 49,857,002 | 33,429,322 | 40,488,642 | 858,458,598 | 738,582,868 | 55,798,466 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

--------------------------------------

**සමස්ත ආදායම් විෂයයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.33,429,322 ක ශේෂයක් හිඟ හිටව පැවතුණි. එසේම, ආදායම් ලේඛන යාවත්කාලීනව පිළියෙල කර නොතිබීමෙන් හා ආදායම් විෂයයන්ට අදාළව ගිණුම්කරණ අඩුපාඩු පැවතීමෙන් එම විෂයයන්ගේ කාර්යසාධනය සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

#### 2.2.3 වරිපනම් හා බදු

-----------------

**(අ)** **2011 සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් එකතු කිරීමේ දී, මූල්‍ය අක්‍රමිකතාවයක් අනාවරණය වූ අතර, තවදුරටත් ක්ෂේත්‍රය තුළ එකී මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව කරුණු හෙළිදරව් වෙමින් පැවතුණි. මේ පිළිබඳව සිදු කරන ලද මූලික හා අවසන් පරීක්ෂාවන් අවසන් වී නොමැති බැවින්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.16,918,855 ක හිඟ හිටි වරිපනම් ශේෂයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි විය.**

**(ආ)** **2015 ජනවාරි 01 දිනෙන් පසු අක්කර බදු පිළිබඳ සමීක්ෂණයක් පවත්වා වාර්ෂිකව බිල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් **2017** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.**662,020** ක් හා මුද්දර ගාස්තු රු.**14,922,420** ක් විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

---------------------------

**3.1** කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ **03** වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

**(i)** ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් **15** ක් ඉටු කිරීම සඳහා රු.**4,200,000** ක මුදලක් වෙන් කර තිබුණ ද, එම අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

**(ii)** ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් **11** ක් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.**21,950,000** ක් ඇස්තමේන්තු කර තිබුණ ද, ඉන් රු.**4,960,429** ක මුදලක් එනම්, සියයට **0.48** ත් සියයට **29** ත් අතර පරාසයකින් වැය කර තිබීමෙන් ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම

--------------------

**2015** වර්ෂයේ සකස් කරන ලද සිව් අවුරුදු සැලැස්ම තුළින් **2017** සිට **2020** දක්වා කාලය තුළ රු.**145,330,000** ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන කර්මාන්ත **557** ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී, රු.**41,550,000** ක් වටිනා කර්මාන්ත **139** ඉටු කිරීමට කටයුතු නොකර වෙනත් කර්මාන්ත ඉටු කර තිබීමෙන්, සභාව විසින් සකස් කර තිබුණු සිව් අවුරුදු සැලැස්ම ප්‍රායෝගික හා ක්‍රියාකාරී මට්ටමේ නොපැවතුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ රු.**4,121,172** ක ඇස්තමේන්තුගත සංවර්ධන යෝජනා **10** ක් ඉටු කිරීම සඳහා **2016** දෙසැම්බර් සිට **2017** සැප්තැම්බර් දක්වා කාලය තුළ අනුමැතිය ලැබී මාස **02** ත් මාස **07** ත් අතර කාල ප්‍රමාදයකින් පසුව එම කර්මාන්තයන්හි වැඩ ආරම්භ කර තිබීමෙන් සභාවේ කාර්යසාධනය පහළ මට්ටමක පැවතුණි.

(ඈ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

--------------------------------------

ග්‍රාමීය මාර්ග කි.මී.**1000** ක් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රදේශයේ වැඩිම ප්‍රතිලාභීන් ප්‍රමාණයක් ආවරණය වන ලෙස මාර්ග සංවර්ධනය කළ යුතු වුවත්, රු.**1,500,000** ක

ඇස්තමේන්තුවක් යටතේ ප්‍රතිලාභීන් 06 දෙනෙකු පමණක් ප්‍රයෝජනයට ගත හැකි කේළමදෙණිය රෝහල අසල අතුරු මාර්ගය සංවර්ධනය කර තිබුණි.

(ඉ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු වන කසළ විධිමත් පරිදි කළමනාකරණය කර බැහැර කිරීම අරමුණු කර ගත් කිරිවවුල මානෙල්අංග කසළ බැහැරලන අංගනය භෞතිකව පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මධ්‍යම පරිසර අධිකාරියේ රු.4,283,097 ක ප්‍රතිපාදන යටතේ ස්ථාපිත කොට 2015 සැප්තැම්බර් 11 දින "නැවත භාවිතයට ගත නොහැකි දේ භාවිතයට ගත හැකි දෙයක් බවට පරිවර්තනය කිරීම" යන තේමාව පෙරදැරි කර ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර ඇතත්, 2018 පෙබරවාරි 21 දින වන විට එහි කොම්පෝස්ට් නිෂ්පාදනය නවතා තිබුණි.

(ii) කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිලි පරිශ්‍රය ඒ සඳහා භාවිතා කිරීමකින් තොරව නොදිරන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ගබඩා කර තිබුණි.

(ඊ) පාරිසරික ගැටළු

-------------------

(i) ක්ෂේත්‍රයේ එකතු කර ගන්නා ලද නොදිරන පොලිතින් හා දිරන කසළ මිශ්‍රව කසළ බැහැර කරනු ලබන භූමියේ බෑවුම් කොටසට අවිධිමත්ව බැහැර කර තිබූ අතර, වැසි දිනවල දි පහළ ප්‍රදේශයේ ජල මූලාශ්‍රවලට අප ජලය මිශ්‍ර වෙමින් පැවතුණි.

(ii) 2015 වර්ෂයේ සිට කිරිවවුල කසළ අංගනයේ කසළ බැහැර කිරීම සිදු කරනු ලැබුව ද, 2018 පෙබරවාරි 22 දින වන විටත් ඒ වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) තිරසාර සංවර්ධන ඉලක්ක

----------------------------

2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සඳහා සැලසුම් පිළියෙල කිරීමක් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

(අ) 2005 සැප්තැම්බර් 22 දින මහා සභා අනුමැතිය මත ග්ලෝබල් කම්පියුටර් සිස්ටම් ආයතනයෙන් රු.42,000 කට වරිපනම් මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණි. මෙම වරිපනම් මෘදුකාංගය යොදා ගනිමින් පසුගිය වර්ෂවල මූල්‍ය අක්‍රමිකතා සිදු කිරීම සම්බන්ධව විගණන විමසුම් නිකුත් කර තිබීම හා අත්‍යවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි වීමත්, තොරතුරු වරදවා සටහන් වීමත් යනාදී දූර්වලතා පැවතියත්, 2018 මැයි වන විටත් පැරණි වරිපනම් මෘදුකාංගයම භාවිතා කර තිබුණි.

(ආ) ණය ලබා ගෙන ඇති සේවකයෙකු ණය සීමාව තුළ නැවත ණය මුදලක් ඉල්ලා සිටීමේ දී ඔහුට ගෙවීමට හැකි ණය ශේෂය පමණක් ලේඛනවල සටහන් කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව පවතින ණය ශේෂය පියා වූ බවට හා වැටුපට අනුව ගෙවිය හැකි මුළු ණය මුදලම නැවත ගෙවීමක් සේ සලකා දෝෂ සහගතව ලේඛනගත කිරීමේ අවිධිමත් ක්‍රමයක් අනුගමනය

**කර තිබුණි. මේ හේතුවෙන් එක් එක් සේවකයින්ගේ ණය ශේෂය හා පොලී පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර තනතුරු 14 ක පුරප්පාඩු හා තනතුරු 01 ක අතිරික්තයක් පැවතුණි.**

**(ආ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.391,762 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

**2016 මාර්තු 17 දිනැති 2016/03 අංක දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව වසර 05 කට වරක්වත් තක්සේරුගත කඩ කුලිය සංශෝධනය කළ යුතු වුවත්, දවුලගල වෙළඳ සංකීර්ණය තුළ පවතින කඩ කාමර 09 ක් සඳහා 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගෙන කුලී අය කර තිබුණි.**

**3.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

**---------------------------------**

**සභාව සතු රු.83,982,759 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 151 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.**

**3.5.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

**(අ) සභාව සතු රු.2,636,000 ක් වටිනා වාහන 04 ක්, මාස 07 ත් වර්ෂ 08 ත් අතර කාල පරිච්ඡේදයක් තුළ ධාවනයට යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.**

**(ආ) වටිනාකම හඳුනාගත නොහැකි මෝටර් රථයක් 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව විනාශ වීමට ඉඩ හැර තිබුණි.**

**(ඇ) මහජන බැංකු දවුලගල ශාඛාවේ සභාව නමින් පවත්වා ගෙන එනු ලබන බැංකු ගිණුමක් වර්ෂ ගණනාවක සිට රු.639,444 ක ශේෂයක් සහිතව නිෂ්ක්‍රීයව පැවතුණි.**

**3.6 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

**සභාවේ ලේකම්වරයා විසින් සභාවේ ත්‍රී රෝද රථයක් පෞද්ගලික කාර්යයක් සඳහා ධාවනයේ යෙදවීමේ දී 2017 මැයි 13 දින අනතුරකට ලක් වී තිබුණි. ඒ සම්බන්ධව විධිමත් පරිදි ක්‍රියා නොකර, රියැදුරුගේ පැමිණි වේලාව වෙනස් කර හා පොලිසියට අනතුර සිදු වූ අවස්ථාව වාර්තා නොකර රු.33,960 ක මුදලක් අලුත්වැඩියා සඳහා වැය කර තිබුණි.**

**3.7** ප්‍රසම්පාදනය

--------------

**3.7.1** වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

------------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) වගන්තිය අනුව, එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙළ කරනු ලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය සඳහා රු.8,110,000 ක් සහ ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තු කිරීම් වැය සඳහා රු.1,350,000 ක් වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර තිබිය දී, එම වැය විෂයයන් සඳහා ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

**3.7.2** කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

බෝයගම ගංගොඩ මායිම් මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය වැඩ අවසන් කර 2018 මැයි 10 දින වන විට රු.211,500 ක් ගෙවා තිබුණි. 1:2:4 (19") සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් **117'-0"x9'-1 ½ ''-0'5''** ප්‍රමාණයේ ඝන මීටර් 12.57 ක් මාර්ගය කොන්ක්‍රීට් කළ බවට බිල්පත් නිර්දේශ කර ඇතත්, භෞතික පරීක්ෂාව අනුව, එය **117'-0"x8'-1''-0'5''** ප්‍රමාණයේ ඝන මීටර් 11.16 ක් ඉටු කර තිබුණි. ඒ අනුව, ඉටු නොකළ ඝන මීටර් 1.41 ක් සඳහා රු.26,497 ක් ගෙවා තිබුණි.

**3.8** දෘශ්‍ය අක්‍රමිකතා

-----------------

ආදායම් පරීක්ෂකවරයෙකු විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ දී හා වරිපනම් බදු අය කිරීමේ දී සිදු කර ඇති මූල්‍ය අක්‍රමිකතාවයක් සම්බන්ධව **CL-01/KD/F/PS-UDN/05/2015/138-ii** හා **CL-01/KD/F/PS-UN/05/2017/138-iii** අංක දරන විගණන විමසුම්වලට වැඩිමනක් ලෙස තවදුරටත් ක්ෂේත්‍රයේ සිදු කරන ලද පරීක්ෂණවල දී රු.22,548 ක මූල්‍ය අක්‍රමිකතාවයක් අනාවරණය වී තිබුණි.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------

අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ආදායම් වියදම් ගිණුමෙහි සියලුම ශේෂ වටිනාකම් නිවැරදිව සකසා නොතිබූ හෙයින්, අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමට නොහැකි විය.

**5.** පද්ධති හා පාලන

-----------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ  අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | --------- | | ------------ |
| (අ) | ගිණුම්කරණ අඩුපාඩු | i. | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීන කර නොතිබීම |
| | | ii. | නියමිත ගිණුම්කරණ මූලධර්ම අනුගමනය නොකිරීම |
| (ආ) | වත්කම්/ දේපළ | i. | ලේඛනගත නොකිරීම |
| | | ii. | ලේඛන යාවත්කාලීන නොවීම |
| | | iii. | වත්කම් ඌන උපයෝජිතව පැවතීම |
| (ඇ) | සේවක කළමනාකරණය | i. | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| | | ii. | නිරවුල් නොවූ ණය ශේෂයන් පැවතීම |
| (ඇ) | ව්‍යාපෘති/ කොන්ත්‍රාත් | i. | ඉදිකිරීම් සම්මත ප්‍රමිතියට අනුකූල නොවීම |
| | | ii. | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම |
| (ඉ) | ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය නොකිරීම |
| | | ii. | ලේඛන යාවත්කාලීන නොවීම |